3 ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම

මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන තේමා පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

3.1 ගනුදෙනු නිවැරදි ව සටහන් කිරීමේ අවශ්‍යතාවය
3.2 ගිණුම්කරණ වැරදි සිදු වීමට බලපාන හේතු
3.3 ගිණුම්කරණ වැරදි සිදු වන අවස්ථා
3.4 ගිණුම්කරණ වැරදි හඳුනා ගැනීම
3.5 ශේෂ පිරික්සුමේ ඓක්‍යය අතර වෙනසක් ඇති නොකරන ගිණුම්කරණ වැරදි
3.6 ශේෂ පිරික්සුමේ ඓක්‍යය අතර වෙනසක් ඇති කරන ගිණුම්කරණ වැරදි
3.7 වැරදි නිවැරදි කර ශේෂ පිරික්සුම තුලනය කිරීම.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

හැඳින්වීම

විවිධ හේතු නිසා ව්‍යාපාරවල ගනුදෙනු නිවැරදි ව පොත්වල වාර්තා නොවීමට ඉඩ තිබේ. මූලික පොත්වල ගනුදෙනු සටහන් කිරීම, ලෙජරයට පිටපත් කිරීම, ශේෂ පිරික්සුම සකස් කිරීම යනාදි අවස්ථාවල වැරදි සිදු වුවහොත් යම් කාලච්ඡේදයක් සඳහා එම ව්‍යාපාරයේ ප්‍රතිඵලය මෙන්ම යම් දිනකට ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ව සත්‍ය තොරතුරු හෙළිදරව් නොවනු ඇත. එම නිසා ගිණුම්කරණයේ දී වැරදි සිදු වී ඇත්දැයි සොයා බලා ඒවා නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු ය. වැරදි තොරතුරු මත ගන්නා තීරණ ව්‍යාපාරයේ දිගු කාලීන පැවැත්මට බාධාවක් වනු ඇත. එම නිසා වැරදි හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමේ වැදගත්කම මෙම පරිච්ඡේදය මගින් ඔබට පැහැදිලිවනු ඇත.

මෙම පරිච්ඡේදයේ දී පහත සඳහන් මූලික යෙදුම් පිළිබඳ ව ඔබගේ අවධානය යොමු කෙරේ.

- ගිණුම්කරණ වැරදි
- අවිනිශ්චිත ගිණුම
- වැරදි නිවැරදි කිරීමෙන් පසු ශේෂ පිරික්සුම

නොමිලේ බෙදහැරීම සඳහා ය.

ගිණුම්කරණ වැරදි නිවැරදි කරමු

තනි පුද්ගල ව්‍යාපාරිකයෙකු වූ පින්දියස් සිල්වා සිය ව්‍යාපාරයේ ආරම්භක අවස්ථාවේ දී ව්‍යාපාරික ගනුදෙනු පොත්වල සටහන් කිරීම පිළිබඳ ව එතරම් උනන්දුවක් දැක්වූයේ නැත. නමුත් ක්‍රමයෙන් ව්‍යාපාරය දියුණුවත් ම ගනුදෙනු පොත්වල සටහන් කිරීමේ අවශ්‍යතාව පිළිබඳ ව සැළකිල්ල යොමු කළේ ය. මේ අනුව සිය ගම් ප්‍රදේශයේ ම උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලද තරුණයෙකු ගනුදෙනු පොත්වල සටහන් කිරීමේ කාර්යය සඳහා යොදවා ගත්තේය. ඔහු ඉතා ම ක්‍රමානුකූල ව සිය කාර්යභාරය ඉටු කරන බව දක්නට ලැබිණ.

වාණිජ අංශයෙන් විශ්ව විද්‍යාල අධ්‍යාපනයේ සහ වෘත්තීය අධ්‍යාපනයේ නිරත වූ සිය දියණිය, නාමලිකා ගමට පැමිණි දිනයක තම ව්‍යාපාරයේ ගනුදෙනු පොත්වල සටහන් කර ඇති ආකාරය පෙන්වීම සඳහා ඇය සිය කාර්යාලයට කැඳවාගෙන ගියේ ය. ව්‍යාපාරයේ ලිපි ලේඛන දියණියට පෙන්වූ පියා පොත්වල සටහන් තැබීම සම්බන්ධයෙන් ඇයගේ අදහස් විමසී ය. බැලූ බැල්මට දිස් වූයේ ඉතා ක්‍රමානුකූලව කටයුතු කරන ආකාරයකි. එහෙත් වඩා විමසිලිමත් අයුරින් එම පොත් පරීක්ෂා කළ දියණියට පෙනී ගියේ ගනුදෙනු පොත්වල සටහන් කිරීමේ යම් යම් අඩු පාඩු පවතින බව ය.

මින් එක් අවස්ථාවක් ලෙස,

"ව්‍යාපාරයේ ප්‍රවාහන කටයුතුවලට යොදා ගත් වෑන් රථය විකිණීම පිළිබඳ ව විකුණුම් ගිණුමේ සටහන් කර තිබුණි. එම නිසා ආදායම වැඩි වී ලාභය ද වැඩි පුර පෙන්නුම් කර ඇති බව දියණිය සිය පියාට ප්‍රකාශ කළා ය."

මේ බව දැන ගැනීමෙන් පියා කලබලයට පත්විය.

"අනේ දුවේ එතකොට මම වැරදි තීරණ අරගෙන තියෙනවා නේද? ලාභය වැඩි නිසා අපේ සේවකයෝ කාටත් ජනවාරි මාසයේ පඩියට අමතර ව රු. 5,000 බැගිනුත් දුන්නා"යි පියා පැවසීය.

මෙවැනි දෑ සිදු වන්නේ මෙම ව්‍යාපාරයේ පමණක් නොවන බව පවසමින් දියණිය සිය පියා සන්සුන් කළා ය.

ව්‍යාපාරයේ ගනුදෙනු සටහන් කිරීමේ දී විවිධ වැරදි සිදු විය හැකි ය. එම වැරදි හඳුනා ගැනීමත් නිවැරදි කිරීමත් එසේ කිරීමේ අවශ්‍යතාවයත් විමසා බලමු.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

3.1 ගනුදෙනු නිවැරදි ව සටහන් කිරීමේ අවශ්‍යතාව

ව්‍යාපාරවල ගිණුම්කරණ පද්ධතිය මගින් එම ව්‍යාපාරයේ අනෙකුත් කටයුතු කෙරේ මහඟු බලපෑමක් සිදු කෙරේ. එ මගින් සැපයෙන තොරතුරු අභ්‍යන්තර පාර්ශ්වයට කළමනාකරණ තීරණ ගැනීමට උපකාර වන අතර, බාහිර පාර්ශ්වයට ද ව්‍යාපාරය පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට ප්‍රයෝජනවත් වනු ඇත. එම නිසා ව්‍යාපාරයේ ගිණුම්කරණ ක්‍රියාවලිය තුළින් නිවැරදි තොරතුරු හෙළිදරව් නොවීමෙන් විවිධ ගැටලුවලට මුහුණ පෑමට සිදු විය හැකි ය. එබැවින් ඕනෑම ව්‍යාපාරයක් සිය ගිණුම් පද්ධතිය තුළ වැරදි ඇති වීම වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ සැලකිළිමත් වීම වැදගත් වේ.

ගනුදෙනු පොත්වල සටහන් කරන විට විවිධ හේතූන් නිසා විවිධ අවස්ථාවල දී විවිධ ආකාරයේ වැරදි සිදු වීමට ඉඩ තිබේ. නමුත් ගිණුම්කරණ ක්‍රියාවලිය පිළිබඳ ව වරින් වර සොයා බැලීම තුළින් වැරදි හඳුනාගෙන ඒවා නිවැරදි කර ගත හැකි වේ.

- ව්‍යාපාරයක් සතු ව පවත්නා සම්පත් විවිධ ස්වරූපයෙන් පවතී. ඒවා නිසි ලෙස ව්‍යාපාර කටයුතු සඳහා යොමු කිරීම, පාලනය කිරීම මෙන් ම භාවිත කිරීම පිළිබඳ තීරණ ගැනීම සඳහා පහසුවනු ඇත.
- යම් කාල පරිච්ඡේදයක් තුළ ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵල, එනම් ලාභාලාභ පිළිබඳ ව දැන ගැනීමටත් හැකියාව ලැබේ.
- යම් දිනකට ව්‍යාපාරය සතු වත්කම්, වගකීම් සහ අයිතිකරුවන්ගේ හිමිකාරත්වයේ වටිනාකම කොපමණ දැයි දැන ගත හැකි ය.
- ගිණුම්කරණ තොරතුරු භාවිත කරන විවිධ පාර්ශ්වයන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා ද ප්‍රයෝජනවත් වේ.

නිදසුන
- ආදායම් බදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා
- සමාගම් රෙජිස්ට්‍රාර්ට ඉදිරිපත් කිරීම සඳහා
- කොටස් හිමියන්ට ඉදිරිපත් කිරීම සඳහා

මේ අයුරින් ව්‍යාපාරයක් සතු සීමිත සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිත කර ගැනීම සඳහා ගනුදෙනු පොත්වල සටහන් කිරීම ඵලදායක වන්නේ එම ක්‍රියාවලිය නිවැරදි ව සිදු වන්නේ නම් පමණි. නමුත් ගිණුම්කරණයේ දී වැරදි සිදු වීමට ඉඩ කඩ තිබේ. එසේ වන්නේ ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ විවිධ හේතූන් නිසා මුළුමනින් ම නිරවද්‍යතාව රඳවා ගැනීමට අපහසු වන හෙයිනි.

3.2 ගිණුම්කරණ වැරදි සිදුවීමට බලපාන හේතු

ව්‍යාපාර ආයතනවල එකිනෙකට වෙනස් ආකාරයේ ගනුදෙනු විශාල සංඛ්‍යාවක් දෛනික ව සිදු වේ. එවැනි ගනුදෙනු විශාල සංඛ්‍යාවක් සිදු වන ව්‍යාපාරවල ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීමේ දී එම කටයුතු මුළුමනින් ම නිවැරදි ව සිදු වන අවස්ථා විරල ය. පහත සඳහන් හේතු නිසා ගිණුම්කරණ කටයුතුවල දී වැරදි සිදු වීමට ඉඩ තිබේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

1. **ගිණුම්කරණ කටයුතුවල යෙදීමේ දී**

නිදසුන
- ගනුදෙනු සටහන් කරන්නාට ගිණුම්කරණ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය නොමැතිකම. (ද්විත්ව සටහන් ක්‍රමය පිළිබඳ ව)
- නොසැලකිළිමත් භාවය
- අමතක වීම සහ මඟ හැරීම්

2. **වංචනික කටයුතු සිදු කිරීමේ අදහසින් සටහන් වෙනස් කිරිම.**

3.3 ගිණුම්කරණ වැරදි සිදු වන අවස්ථා

❋ **ගිණුම්කරණයේ ආරම්භක අවස්ථාව වන මූලික පොත්වල ගනුදෙනු සටහන් කිරීමේ දී,**

නිදසුන්
- රු. 15,000ක ගැනුම් ඉන්වොයිසියක් ගැනුම් ජ'නලයේ සටහන් නොවීම.
- රු. 3,500ක විදුලිය වියදම් ගෙවීම මුදල් පොතේ සටහන් නොවීම.

❋ **මූලික පොත්වල තැබූ සටහන් ලෙජරයට පිටපත් කිරීමේ දී,**

නිදසුන්
- ආපසු යැවුම් ජ'නලයේ එකතුව රු.6,500 ආපසු යැවුම් ගිණුමට රු.6,000ක් ලෙස පිටපත් කිරීම.
- රු. 2,900ක ලිපි ද්‍රව්‍ය මිල දී ගැනීම ලිපි ද්‍රව්‍ය ගිණුමට පිටපත් නොකිරීම.

❋ **ලෙජර ගිණුම් තුලනය කිරීමේ දී**

නිදසුන් ◉ පහත දක්වෙන බැංකු ණය ගිණුම තුලනය කර ඇති ආකාරය බලන්න.

හර　　　　　　　　　　**බැංකු ණය ගිණුම**　　　　　　　　　　බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු
	මුදල්		3,000		මුදල්		15,000
	ශේෂය ප/ගෙ		★ 13,000				
			15,000				15,000
					ශේෂය ඉ/ගෙ	★	13,000

මෙම ගිණුම තුලනය කිරීමෙන් ලැබිය යුතු ශේෂය රු.12,000ක් වුවත් ගිණුම තුලනය කිරීමෙන් ලබා ගෙන ඇත්තේ රු.13,000කි. මෙවැනි වැරදි ගිණුම් තුලනය කිරීමේ දී සිදු වීමට පුළුවන.

❋ තුලනය කරන ලද ගිණුම්වල ශේෂයන් ඇසුරෙන් ශේෂ පිරික්සුම සකස් කිරීමේ දී

නිදසුන්
- රු. 13,000ක ලී බඩු ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට උපුටා නොගැනීම.
- රු. 1,400ක රක්ෂණ ගිණුමේ ශේෂය රු. 400ක් ලෙස ශේෂ පිරික්සුමේ සටහන් කිරීම.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මේ වන විට ඔබ ගිණුම්කරණ ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල දී වැරදි සිදු වන බව දන සිටී. ඉන් පසු අවශ්‍යවනුයේ මෙම වැරදි කෙසේ නිවැරදි කළ යුතු ද යන්න දැන ගැනීම ය.

ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම සඳහා භාවිත කළ යුතු වන්නේ පොදු ජ'නලය යි. ද්විත්ව සටහන් ක්‍රමය පදනම් කර ගනිමින් පොදු ජ'නලයේ සටහන් තබා ඉන් පසු අදාළ ගිණුම්වලට පිටපත් කිරීම අවශ්‍ය වේ.

ගිණුම්කරණයේ දී සිදුවන වැරදි නිවැරදි කිරීම සඳහා ප්‍රථමයෙන් එම වැරදි හඳුනාගත යුතු වේ.



3.4 ගිණුම්කරණ වැරදි හඳුනා ගැනීම

ව්‍යාපාරයක ලෙජර ගිණුම්වල ද්විත්ව සටහන් ක්‍රමය අනුගමනය කරමින් ගනුදෙනු සටහන කරන බැවින්, සකස් කරනු ලබන ශේෂ පිරික්සුමේ හර සහ බැර ශේෂවල එකතුව සමාන විය යුතු ය. ශේෂ පිරික්සුමේ හර සහ බැර ශේෂවල එකතුව සමාන නොවූ විට ගිණුම් තැබීමේ දෝෂ පවතින බව පැහැදිලි ය. නමුත් හර සහ බැර ශේෂවල එකතු සම වුව ද ගිණුම්කරණ දෝෂ තිබීමට පුළුවන.

මේ අනුව වැරදි නිවැරදි කිරීම සඳහා පළමුව පහත දැක්වෙන අයුරින් වැරදි හඳුනා ගැනීම අවශ්‍යවනු ඇත.

1. ශේෂ පිරික්සුමේ ඓක්‍යය අතර වෙනසක් ඇති නොකරන වැරදි
2. ශේෂ පිරික්සුමේ ඓක්‍යය අතර වෙනසක් ඇති කරන වැරදි

දැන් අපි මෙම එක් එක් වැරදි වර්ග වෙන වෙන ම සලකා බලමු.

නොමිලේ බෙදහැරීම සඳහා ය.

3.5 ශේෂ පිරික්සුමේ ඓක්‍යය අතර වෙනසක් ඇති නොකරන ගිණුම්කරණ වැරදි

මේවා ශේෂ පිරික්සුමක් මගින් හෙළිදරව් නොවන වැරදි ලෙස ද හඳුන්වයි. එනම් මෙම වැරදි තිබුණ ද ශේෂ පිරික්සුමේ හර හා බැර ශේෂයන්ගේ ඓක්‍යය සමාන වන නිසාය. පහත සඳහන් වන්නේ මෙම වර්ගයට අයත් වන වැරදි කිහිපයකට නිදසුන් සහ ඒවා නිවැරදි කරනු ලබන ආකාරයයි.

1. ගනුදෙනුව ගිණුම් පොත්වල සම්පූර්ණයෙන් ම සටහන් නොවීම

යම් ගනුදෙනුවක ද්විත්ව සටහන ගිණුම් පොත්වල සටහන් නොවීම නිසා සිදු වන වැරදි මින් අදහස් කෙරේ. මේවා අත්හැරීම් දෝෂ ලෙසද හඳුන්වයි. මෙවැනි වැරදි තිබුණ ද ශේෂ පිරික්සුමේ තුලනය වීමට බාධාවක් නොවේ. මෙවැනි වැරදි නිවැරදි කිරීම සඳහා ගනුදෙනුවට අදළ ද්විත්ව සටහන යොදගත යුතු වේ.

මෙම වර්ගයට අදළ නිදසුනක් සහ එය නිවැරදි කරන ආකාරය අධ්‍යයනය කරන්න.

නිදසුන් • රු. 1,600 ක විදුලිය වියදම් චෙක්පතකින් ගෙවීම ගිණුම්වල සටහන් වී නැත.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		විදුලි වියදම් ගිණුම හර බැංකු ගිණුම රු 1,600 විදුලි වියදම් පොත්වල සටහන් නොවී මෙන් වු වරද නිවැරදි කිරිම		1,600	1,600

2. ගනුදෙනුවක නියමිත වටිනාකම අඩුවෙන් හෝ වැඩියෙන් ගිණුම් දෙකේ ම සටහන් වීම.

විවිධ හේතු නිසා ගනුදෙනුවේ නියමිත වටිනාකම අඩුවෙන් හෝ වැඩියෙන් ගිණුම්වල සටහන් වීම සිදු විය හැකි ය.

මෙසේ ගනුදෙනුවකට අදළ වටිනාකම ගිණුම් දෙකේ ම සමාන වටිනාකම්වලින් අඩුවෙන් හෝ වැඩියෙන් සටහන් වුවහොත් එය ශේෂ පිරික්සුම තුලනය වීමට බාධාවක් නොවේ. මෙවැනි වරදකට නිදසුන් සහ ඒවා නිවැරදි කරන ආකාරය අධ්‍යයනය කරන්න.

නිදසුන් • රම්‍යා වෙළඳ සලෙන් ආපසු එවූ රු. 1,300 ක භාණ්ඩ පිළිබඳ ව ගිණුම්වල සටහන් තබා ඇත්තේ රු. 300ක් වශයෙනි.

මෙහි දී ගිණුම් දෙකේ ම වටිනාකම අඩුවෙන් ලියා තිබේ. එම නිසා අදාළ ගිණුම් දෙකට ම අඩුවෙන් සටහන් කර ඇති වටිනාකම ඇතුළත් කිරීම අවශ්‍ය වේ.

නොමිලේ බෙදහැරීම සඳහා ය.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		ආපසු එවුම් ගිණුම හර රම්‍යා වෙළෙඳ සල රු. 1,300ක ආපසු එවුම් රු.300ක් ලෙස ගිණුම් ගත විමේ වරද නිවැරදි කිරිම.		1,000	1,000

නිදසුන් රු. 5,000ක දුන් වට්ටම් රු. 5,500ක් ලෙස ගිණුම්වල සටහන්ව තිබිම.

ගිණුම් දෙකේ ම වටිනාකම වැඩියෙන් ලියා තිබේ. වැඩියෙන් සටහන්ව ඇති ප්‍රමාණය ගිණුම්වලින් ඉවත් කිරිම අවශ්‍ය වේ.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		ණය ගැති ගිණුම හර දුන් වට්ටම් ගිණුම රු. 5,000ක් වු දුන් වට්ටම් රු. 5,500ක් ගිණුම් ගත විමෙන් වු වරද නිවැරදි කිරීම.		500	500

3. එකම ගනුදෙනුව ඇතැම් විට ගිණුම් පොත්වල දෙවරක් සටහන් විය හැකි ය.

නිදසුන් රු. 2,700ක භාණ්ඩ ණය හිමියන්ට ආපසු යැවීම ගිණුම්වල දෙවරක් සටහන්ව තිබිම.

මෙවැනි වැරදි නිවැරදි කිරිමේ දී අදාළ ගිණුම්වල සටහන් තබා ඇති පැත්තේ නොව විරුද්ධ පැත්තේ ඇතුළත් කිරීමෙන් සටහන් දෙකෙන් එකක් ඉවත්වනු ඇත.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		ආපසු යැවුම් හර ණය හිමි ගිණුම රු. 2,700ක භාණ්ඩ ආපසු යැවීම ගිණුම්වල දෙවරක් සටහන් කිරිමෙන් වු වරද නිවැරදි කිරිම.		2,700	2,700

4. මූල ධර්ම දෝෂ (Errors of Principle)

පිළිගත් ගිණුම්කරණ මූල ධර්මවලට පටහැනිව ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරිම මගින් ඇති වන දෝෂ මූලධර්ම දෝෂ නම් වේ. එහෙත් ඒවා නියමිත වටිනාකමට අනුව ද්විත්ව සටහන් තැබිම නිසා ශේෂ පිරික්සුම තුලනය වීම කෙරෙහි බලපෑමක් ඇති නො කරයි.

නොමිලේ බෙදහැරීම සඳහා ය.

නිදසුන් රු. 12,000ක කාර්යාල උපකරණ අත්පත් කර ගැනිම ගැනුම් ගිණුමේ ලියා ඇත.

කාර්යාල උපකරණ ලබාගෙන ඇත්තේ ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහාය. එය ඇතුළත් කළ යුත්තේ කාර්යාල උපකරණ ගිණුමටය. ගැනුම් ගිණුමේ ඇතුළත් කරනු ලබන්නේ නැවත විකිණීම පිණිස මිලදී ගන්නා භාණ්ඩ පමණි.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		කාර්යාල උපකරණ ගිණුම හර		12,000	
		ගැනුම් ගිණුම			12,000
		රු. 12,000ක කාර්යාල උපකරණ ණයට ගැනිම ගැනුම් ගිණුමේ සටහන් කිරිමෙන් වූ වරද නිවැරදි කිරිම			

නිදසුන් රු. 3,500ක මෝටර් රථ අලුත්වැඩියා වියදම් මෝටර් රථ ගිණුමේ සටහන් කිරිම.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		මෝටර් රථ අලුත්වැඩියා වියදම් හර		3,500	
		මෝටර් රථ ගිණුම			3,500
		රු. 3,500ක මෝටර් රථ අලුත්වැඩියා වියදම් මෝටර් රථ ගිණුමේ සටහන් කිරිමේ වරද නිවැරදි කිරිම.			

5. හිලව් දෝෂ (Compensating Errors)

ඇතැම් අවස්ථාවල දී එක් ලෙජර ගිණුමක වටිනාකම වැරදි අයුරින් සටහන් ව තිබීම තවත් ලෙජර ගිණුමක හෝ ගිණුම් කිහිපයක වටිනාකම වැරදි ලෙස සටහන් වීම තුළින් මග හැරීයයි. එම නිසා ශේෂ පිරික්සුමේ හර පැත්තේ එකතුව බැර පැත්තේ එකතුවට සමාන වන හෙයින් මෙවැනි වැරදි සෘජු ව ම ශේෂ පිරික්සුමෙන් අනාවරණය නොවේ.

නිදසුන් රු. 3,000ක භාණ්ඩ සුසිල්ට ණයට විකිණීම ඔහුගේ ගිණුමේ රු.5,000ක් ලෙස සටහන් ව තිබු අතර රු. 5,000ක භාණ්ඩ සමීරට ණයට විකිණීම ඔහුගේ ගිණුමේ සටහන් ව තිබුණේ රු. 3,000ක් වශයෙනි.

මෙහි දී සුසිල්ගේ ගිණුමේ හර පැත්තේ අගය රු. 2,000ක් වැඩියෙන් ද සමීරගේ ගිණුමේ හර පැත්තේ අගය රු. 2,000ක් අඩුවෙන් ද සටහන් ව ඇත. මේ අනුව ශේෂ පිරික්සුම සකස් කිරිමේ දි එක් ගිණුමක හර ශේෂය රු. 2,000ක් අඩුවෙනුත් තවත් ගිණුමක හර ශේෂය රු. 2,000ක් වැඩියෙනුත් සටහන්ව තිබේ. එම නිසා ශේෂ පිරික්සුමේ තුලනයට බාධාවක් නොවේ. එය නිවැරදි කරන්නේ මෙසේ ය.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		සමීරගේ ගිණුම හර සුසිල්ගේ ගිණුම සමීරගේ ගිණුමේ අගය රු.2,000ක් අඩුවෙනුත් සුසිල්ගේ ගිණුමේ අගය රු.2,000ක් වැඩියෙනුත් සටහන් වීමේ වරද නිවැරදි කිරීම.		2,000 	 2,000

ක්‍රියාකාරකම් 01

වයාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලියට සම්බන්ධ වූ කණ්ඩායම විසින් පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ හර ශේෂයන්ගේ එකතුව බැර ශේෂයන්ගේ එකතුවට සමාන වීම නිසා බෙහෙවින් සතුටට පත්විය. "ශේෂ පිරික්සුම තුලනය වුනා. දැන් අපට **නිවැරදි** ව අවසාන ගිණුම් පිළියෙල කරන්න පුළුවන් " යනුවෙන් ප්‍රකාශ කරන ලදී.

- ❋ මෙම ප්‍රකාශය හොඳින් කියවන්න.
- ❋ තද කළු අකුරින් මුද්‍රිත පදය කෙරෙහි සැලකිලිමත් වන්න.
- ❋ මෙම ප්‍රකාශය පිළිබඳ ව ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.

ක්‍රියාකාරකම් 02

සරණදස තොග වෙළෙන්දෙකි. ඔහුගේ ව්‍යාපාරයේ 20xx ජනවාරි 31 දිනට සකස් කළ ශේෂ පිරික්සුම සමාන විය. නමුත් හොඳින් පරීක්ෂා කර බැලීමේ දී ගිණුම්කරණ වැරදි තිබෙන බව දැන ගැනීමට ලැබිණ. එම වැරදි පහත දැක්වේ.

i. රු. 1,500ක හර පතක් පොත්වල සටහන්ව නැත.
ii. රු. 2,700ක ලිපි ද්‍රව්‍ය මිලට ගැනීම ගිණුම්වල ලියා ඇත්තේ රු. 700ක් වශයෙනි.
iii. මෝටර් රථ අලුත්වැඩියා වියදම් සඳහා ගෙවන ලද රු. 5,000ක් මෝටර් රථ ගිණුමේ ලියා ඇත
iv. රු. 2,500ක ණයට විකුණුම් ගිණුම්වල දෙවරක් ලියා තිබිණ.
v. රු. 2,700ක විදුලිය වියදම් ගෙවීම විවිධ වියදම් ගිණුමේ ලියා ඇත.

වැරදි නිවැරදි කිරීමේ සටහන් තබන ආකාරය පොදු ජ'නලයක් මඟින් ඉදිරිපත් කරන්න.

ක්‍රියාකාරකම 03

පහත දැක්වෙන්නේ වැරදි නිවැරදි කිරීම් සම්බන්ධයෙන් පොදු ජ'නලයේ ඇතුළත් වූ ද්විත්ව සටහන් කිහිපයකි.

i.	විදුලි වියදම් ගිණුම	හර	350	
	විවිධ වියදම් ගිණුම			350
ii.	ගැනුම් ගිණුම	හර	13,000	
	ණය හිමි ගිණුම			13,000
iii.	මෝටර් රථ අලුත්වැඩියා වියදම් ගිණුම	හර	2,800	
	මෝටර් රථ ගිණුම			2,800
iv.	විකුණුම් ගිණුම	හර	4,000	
	ණය ගැති ගිණුම			4,000

මෙම ද්විත්ව සටහන් වෙනුවෙන් සුදුසු සංලක්ෂ්‍යයන් ඉදිරිපත් කරන්න.

3.6 ශේෂ පිරික්සුමේ ඓක්‍යය අතර වෙනසක් ඇති කරන ගිණුම්කරණ වැරදි

ගිණුම්කරණ ක්‍රියාවලියේ දී සමහර වැරදි සිදු වුවත් ඒවා නිසා ශේෂ පිරික්සුමේ හර සහ බැර තීරුවල ඓක්‍යය අතර වෙනසක් ඇති නොවන බව මේ වන විට ඔබ අවබෝධ කර ගෙන සිටී. නමුත් ගනුදෙනු සටහන් කිරීමේ දී සිදුවන ඇතැම් වැරදි නිසා ශේෂ පිරික්සුමේ ඓක්‍යය අතර වෙනස්කම් දක්නට ලැබේ. එම නිසා මෙම වැරදි ශේෂ පිරික්සුමක් මඟින් හෙළිදරව් වන වැරදි වශයෙන් හඳුනාගනී.

මෙසේ ශේෂ පිරික්සුමේ ඓක්‍යය අතර වෙනසක් ඇති වූ විට එම වැරදි නිවැරදි කිරීම පිළිබඳව අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ අවබෝධ කර ගනිමු.

- ශේෂ පිරික්සුමේ හර සහ බැර තීරු දෙකේ ඓක්‍යය අතර වෙනස සොයා ගන්න.
- එම වෙනස ඇති වීමට හේතු අවිනිශ්චිත බැවින් එම අඩු වටිනාකම පෙන්නුම් කරන සංඛ්‍යාව ඉදිරියෙන් අවිනිශ්චිත ගිණුම යැයි සඳහන් කොට ශේෂ පිරික්සුම තාවකාලික ව සමාන කරන්න.
- අසමාන වීමට හේතු සොයන්න.
- එසේ සොයා ගත් වැරදි පොදු ජ'නලයේ ද්විත්ව සටහන් තැබීම මගින් නිවැරදි කරන්න.



අවිනිශ්චිත ගිණුමක් විවෘත කිරීම මෙසේ නිදසුනක් මඟින් පැහැදිලි කර ගත හැකි ය.

පහත දැක්වෙන්නේ සුධීරාගේ ව්‍යාපාරයේ 20XX.12.31 දිනට සකස් කළ තුලනය නොවූ ශේෂ පිරික්සුමයි. එහි බැර පැත්තේ එකතුවේ වූ අඩු වටිනාකම ඉදිරියෙන් අවිනිශ්චිත ගිණුම යන්න සඳහන් කොට ශේෂ පිරික්සුම තාවකාලිකව තුලනය කර ඇත.

සුධීරාගේ ව්‍යාපාරය

20XX.12.31 දිනට ශේෂ පිරික්සුම

විස්තරය	ලෙ පි	හර රු	බැර රු
මුදල් පොත		10,000	
ගැනුම් / විකුණුම්		27,000	42,000
වේතන		6,500	
උපකරණ		46,500	
බැංකු ණය			17,200
ප්‍රාග්ධනය			30,000
විවිධ වියදම්		5,600	
ලද කොමිස්			2,600
ණය ගැතියෝ / ණය හිමියෝ		4,000	10,000
ලද වට්ටම්			3,000
ඉතිරි බඩු තොගය		15,000	
ආපසු යැවුම්			4,000
අවිනිශ්චිත ගිණුම (වෙනස)			5,800
		1,14600	1,14600

මෙසේ අවිනිශ්චිත ගිණුම යොදා ගනිමින් ශේෂ පිරික්සුම තාවකාලිකව තුලනය කරන ආකාරය පිළිබඳ ව දැන් ඔබට පැහැදිලි වනු ඇත.

එම වෙනස පොදු ජ'නලයේ සටහන් කරන ආකාරය පහත දැක්වේ.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		අවිනිශ්චිත ගිණුම ශේෂ පිරික්සුමේ වෙනස අවිනිශ්චිත ගිණුමක සටහන් කිරීම.			5,800

මෙම අවස්ථාවේ පොදු ජ'නලයේ ද්විත්ව සටහනක් ඇතුළත් නොවන බව ඔබට පෙනෙනු ඇත. මෙහි දී සිදුව ඇත්තේ ශේෂ පිරික්සුමේ වෙනස අවිනිශ්චිත ගිණුමේ ඇතුළත් කිරීම සඳහා සටහනක් තැබීම පමණි.

අවිනිශ්චිත ගිණුමෙහි, ශේෂ පිරික්සුමේ වෙනස මෙසේ ඇතුළත් කළ හැකි ය.

හර **අවිනිශ්චිත ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු
					ශේෂ පිරික්සුමේ වෙනස		5,800

ක්‍රියාකාරකම් 04

ව්‍යාපාරයක් ගිණුම් කාලච්ඡේදය අවසාන වන දිනට සකස් කළ ශේෂ පිරික්සුමේ හර ශේෂයන්ගේ එකතුව බැර ශේෂයන්ගේ එකතුවට සමාන නොවීය. ශේෂ පිරික්සුම තාවකාලික ව තුලනය කර ගැනීමට ඔවුන්ට අවශ්‍යව තිබේ. මේ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල පිළිබඳ ව ඔබේ උපදෙස් ඉදිරිපත් කරන්න.

අවිනිශ්චිත ගිණුම

ශේෂ පිරික්සුමේ ඓක්‍යයන් සම නොවූ විට ඊට හේතු වූ වැරදි සොයා ඒවා නිවැරදි කරනතෙක් ඓක්‍යය අතර වෙනස ඇතුළත් කරන තාවකාලික ගිණුම **අවිනිශ්චිත ගිණුම** යනුවෙන් හඳුන්වනු ලැබේ.

එමෙන් ම ගනුදෙනුවල සත්‍ය තත්ත්වය පිළිබඳ ව නිශ්චිත අවබෝධයක් නොමැති අවස්ථාවක එවැනි ගනුදෙනු සටහන් කිරීමට ද අවිනිශ්චිත ගිණුම යොදා ගනී. මෙම වැරදි නිවැරදි කිරීමෙන් පසුව අවිනිශ්චිත ගිණුම පොත්වලින් ඉවත් වේ.

ශේෂ පිරික්සුමෙන් හෙළිදරව් වන වැරදි නිවැරදි කිරීම සඳහා යොදා ගන්නා ද්විත්ව සටහනෙන් එක් සටහනක් අවිනිශ්චිත ගිණුමේ ඇතුළත් කෙරෙන බව වටහා ගැනීම වැදගත් වේ. මෙසේ සිදු වන වැරදි හා ඒවා නිවැරදි කරන ආකාරය නිදසුන් කිහිපයක් මගින් විමසා බලමු.

1. ගනුදෙනුවක ද්විත්ව සටහනෙන් එක් සටහනක් පමණක් ගිණුම් පොත්වල සටහන් කර අනිත් සටහන මඟ හැරී තිබීම.

නිදසුන් රු. 3,500 ක ලිපි ද්‍රව්‍ය මිලට ගැනීම මුදල් පොතේ පමණක් ලියා ඇත.

මෙහි දී ලිපි ද්‍රව්‍ය ගිණුමට හර නොකිරීම නිසා ශේෂ පිරික්සුමේ හර පැත්තේ එකතුව අඩුවෙන් පෙන්නුම් කරයි. මෙවැනි තත්ත්වයක දී අවිනිශ්චිත ගිණුමේ රු.3,500ක හර ශේෂයක් ඇති වේ. එම නිසා වැරදි නිවැරදි කරන විට එම හර ශේෂ ඉවත්ව යා යුතු ය.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		ලිපි ද්‍රව්‍ය ගිණුම හර අවිනිශ්චිත ගිණුම රු. 3,500ක් ලිපි ද්‍රව්‍ය ගිණුමේ සටහන් නොවීමෙන් වූ වරද නිවැරදි කිරීම.		3,500	3,500

2. ගනුදෙනුවක ද්විත්ව සටහනෙන් එක් සටහනක් අදාළ ගිණුමේ නිවැරදිව සටහන් කර අනෙක් සටහන සඳහා වැරදි සංඛ්‍යාවක් අදාළ ගිණුමට පිටපත් කර තිබීම.

නිදසුන් රු. 15,000ක ලී බඩු අත් පිට මුදලට ගැනීම මුදල් පොතේ නිවැරදි ව සටහන් කර ලී බඩු ගිණුමේ රු. 5,000ක් ලෙස සටහන් කිරීම.

මෙම වරද නිසා ශේෂ පිරික්සුමේ හර පැත්තේ අගය රු. 10,000ක අඩුවක් ඇති වේ. ඒ වෙනුවෙන් අවිනිශ්චිත ගිණුමේ රු. 10,000ක් හර කිරීම සිදු වේ. මේ වරද නිවැරදි කිරීමේ දී අවිනිශ්චිත ගිණුමේ හර කළ අගය ඉවත් වීම සිදු වන ආකාරය බලමු.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		ලී බඩු ගිණුම හර අවිනිශ්චිත ගිණුම ලී බඩු ගිණුමේ රු.10,000ක් අඩුවෙන් සටහන් වූ වරද නිවැරදි කිරීම.		10,000	10,000

3. ගනුදෙනුවක ද්විත්ව සටහන අදාළ ගිණුම්වල එකම පැත්තේ සටහන් කර තිබීම.

මෙවැනි වරදක් නිසා අදාළ පැත්තේ සටහන් නොවීම සහ වැරදි පැත්තේ සටහන් වීම හේතුවෙන් වැරදි දෙකක් ම සිදු වී ඇත. එම නිසා වැරදි වටිනාකම මෙන් දෙගුණයකින් ශේෂ පිරික්සුමේ එකතුව වෙනස් වේ.

නිදසුන් කැළුම් නැමැති ණය ගැතියා ආපසු එවූ රු. 3,000ක භාණ්ඩ පිළිබඳ ව ආපසු එවුම් ගිණුමට මෙන් ම ණයගැති කැළුම්ගේ ගිණුමට ද හර කිරීම.

මේ අනුව කැළුම්ගේ ගිණුමට රු. 3,000ක් බැර නොවීමත් එම ගිණුමට රු.3,000ක් හර කිරීමත් යන වැරදි දෙකම සිදු වී තිබේ.

මේ හේතුවෙන් ශේෂ පිරික්සුමේ බැර පැත්තේ අගය රු. 6,000ක් අඩු වී ඇති බව පෙනේ. එම නිසා අවිනිශ්චිත ගිණුමේ බැර පැත්තේ රු. 6,000ක් සටහන් කරනු ලැබේ. වරද නිවැරදි කිරීමේ දී මෙම දෝෂ දෙකම එකවර ඉවත් කිරීමට පුළුවන.

එනම් කැළුම්ගේ ගිණුමට වැරදිමකින් හර කළ රු. 3,000 ඉවත් කිරීම සඳහා එම ගිණුමට **රු. 3,000ක් බැර කිරීම** සහ අදාළ නිවැරදි සටහන තැබීම වෙනුවෙන් නැවත එම ගිණුමට **රු. 3,000ක් බැර කිරීම මගිනි.**

මෙහි දී සටහන් දෙකම එකවර ගිණුම් තබන ආකාරය පහත දැක්වේ.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		අවිනිශ්චිත ගිණුම හර කැළුම් කැළුම්ගේ ගිණුමට බැර කළ යුතු රු. 3,000 හර කිරීමෙන් වූ වරද නිවැරදි කිරීම.		6,000	6,000

4. මූලික පොත්වල හෝ ලෙජර ගිණුම්වල හෝ අයිතමයන් එකතු කිරීමේ දී, තුලනය කිරීමේ දී, ශේෂය ඉදිරි පිටුවට ගෙනයාමේ දී සිදු වන වැරදි

නිදසුන් ගැනුම් ජ'නලය එකතු කිරීමේ දී රු. 2,000ක් අඩු වීම.

මෙවිට ශේෂ පිරික්සුමේ හර පැත්තේ රු. 2,000ක වටිනාකම අඩු වීම නිසා හර එකතුව රු. 2,000කින් අඩු වේ. එම වෙනස අවිනිශ්චිත ගිණුමේ හර පැත්තේ ඇතුළත් කෙරේ. වරද නිවැරදි කිරීමේ දී අවිනිශ්චිත ගිණුම ඉවත් ව යන ආකාරය බලමු.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		ගැනුම් ගිණුම හර අවිනිශ්චිත ගිණුම ගැනුම් ජ'නලයේ රු. 2,000ක් අඩුවෙන් සටහන් වීමෙන් වූ වරද නිවැරදි කිරීම.		2,000	2,000

නිදසුන් - ණයහිමි ගිණුමේ රු. 13,500ක ශේෂය ඉදිරි පිටුවට ගෙන ගොස් ඇත්තේ රු. 3,500ක් වශයෙනි.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මේ හේතුවෙන් ශේෂ පිරික්සුමේ බැර පැත්තේ රු. 10,000ක් අඩුවෙන් සටහන් වීම නිසා බැර පැත්තේ එකතුව ද රු. 10,000ක් අඩු වේ. එම වෙනස අවිනිශ්චිත ගිණුමේ බැර පැත්තේ සටහන් කරයි. මෙම වරද නිවැරදි කිරීමෙන් පසුව අවිනිශ්චිත ගිණුම ඉවත්ව යන ආකාරය සොයා බලමු.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		අවිනිශ්චිත ගිණුම හර ණයහිමි ගිණුම ණය හිමි ගිණුමේ රු. 13,500ක බැර ශේෂ රු.3,500ක් ලෙස ඉදිරියට ගෙනයාමෙන් සිදු වූ වරද නිවැරදි කිරිම.		10,000	10,000

5. ශේෂ පිරික්සුම පිළියෙල කිරිමේ දී සිදු වන වැරදි

ගිණුම්කරණ ක්‍රියාවලියේ වැදගත් සන්ධිස්ථානයක් වන ශේෂ පිරික්සුම පිළියෙල කිරිමේ දී ද වැරදි සිදු වීමට ඉඩ තිබේ. එසේ සිදු වන වැරදි කිහිපයක් පළමුව සොයා බලමු.

- ❋ අදාළ ගිණුම් ශේෂයන් ශේෂ පිරික්සුමට උපුටා නොගැනීම.
- ❋ නියමිත වටිනාකම වෙනුවට වැරදි වටිනාකමක් උපුටා ගැනීම.
- ❋ ශේෂයන්, ශේෂ පිරික්සුමේ වැරදි පැත්තෙහි සටහන් කිරීම.

මෙවැනි වැරදි පිළිබඳ ව ඔබ විශේෂ අවධානයක් යොමු කිරිම අවශ්‍ය වේ. මෙම වැරදි නිසා බලපෑමක් ඇති වන ස්ථානය කෙරේ විමසිලිමත් වන්න. මෙහි දී සිදු ව ඇත්තේ ශේෂ පිරික්සුමට උපුටා ගැනීමේ දි වරදක් සිදු වීම පමණක් බව සිහිපත් කර ගන්න. ගිණුම්වල කිසිදු වරදක් සිදු ව නැත. එම නිසා මෙවැනි වැරදි නිවැරදි කිරිමේ දී ගිණුම්වල සටහන් තැබීම අවශ්‍ය නොවන බව සිතන්න. මෙවැනි වැරදි නිසා ශේෂ පිරික්සුමේ එකතු අතර වෙනසක් ඇති වේ. එම වෙනස වෙනුවෙන් අවිනිශ්චිත ගිණුමක් විවෘත කර තිබේ. එසේ නම් වැරදි නිවැරදි කිරිමේ දී සිදු විය යුත්තේ විවෘත කළ අවිනිශ්චිත ගිණුම ඉවත් කිරීම පමණක් බව තේරුම් ගන්න.

ශේෂ පිරික්සුමට පිටපත් කිරිමේ දී සිදුවන වැරදි නිවැරදි කිරිම සඳහා අවිනිශ්චිත ගිණුමේ පමණක් සටහන් තබනු ලැබේ.

නිදසුන් රු. 18,000ක ප්‍රචාරණ ගාස්තු ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට උපුටාගෙන නැත.

මෙම වරද නිසා

- ❋ ප්‍රචාරණ ගාස්තු ගිණුමට කිසිදු බලපෑමක් සිදුවී නොමැත.
- ❋ ශේෂ පිරික්සුමේ හර පැත්තේ රු.18,000ක් සටහන් නොවීම නිසා හර පැත්තේ එකතුව රු.18,000ක් අඩු වී තිබේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

එම නිසා අවිනිශ්චිත ගිණුමේ හර පැත්තේ රු.18,000 ක් ඇතුළත් කර තිබේ. මෙම වරද නිවැරදි කිරීමේ දී,

- ✵ ප්‍රචාරණ ගාස්තු ගිණුමේ කිසිදු සටහනක් තැබීමක් අවශ්‍ය නොවේ.
- ✵ අවිනිශ්චිත ගිණුමේ හර කර ඇති වටිනාකම ඉවත් කිරීම. (බැර කිරීම) පමණක් සිදු කරනු ලැබේ.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		අවිනිශ්චිත ගිණුම ප්‍රචාරණ ගාස්තු ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට ඇතුළත් නොවීම නිසා අවිනිශ්චිත ගිණුමේ සටහන් කළ අගය ඉවත් කිරීම.			18,000

නිදසුන් ලද පොලී ගිණුමේ ශේෂය වු රු. 7,500 ශේෂ පිරික්සුමේ රු.7,000ක් ලෙස සටහන් වී තිබීම.

මෙම වරද නිසා ශේෂ පිරික්සුමේ බැර පැත්තේ රු. 500ක් අඩුවෙන් සටහන් වීමෙන් බැර පැත්තේ එකතුව රු. 500 අඩු වන බව ඔබට පැහැදිලිවනු ඇත. එම නිසා මෙම රු. 500 අවිනිශ්චිත ගිණුමේ බැර පැත්තේ සටහන් කරනු ඇත.

- ✵ ලද පොලී ගිණුමේ කිසිදු අඩුපාඩුවක් සිදු වී නොමැත. මෙම වරද නිවැරදි කිරීමේ දී අවිනිශ්චිත ගිණුමේ පවත්නා රු.500ක බැර වටිනාකම ඉවත් කිරීම පමණක් සිදු වන බව ඔබට අවබෝධ වනු ඇත.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
		අවිනිශ්චිත ගිණුම හර ලද පොලී ගිණුමේ ශේෂය වු රු.7,500 ශේෂ පිරික්සුමේ 7,000ක් ලෙස දැක්වීම නිසා අවිනිශ්චිත ගිණුමට ගෙන ගිය රු.500 එම ගිණුමෙන් ඉවත් කිරීම.		500	

ගිණුම්කරණ වැරදි වශයෙන් ශේෂ පිරික්සුමේ ඓක්‍යයට බලපෑමක් ඇති නොකරන විවිධ වැරදි වර්ග ද, ශේෂ පිරික්සුමේ ඓක්‍යයට බලපෑමක් ඇති කරන විවිධ වැරදි වර්ග ද පිළිබඳ ව ඔබට පැහැදිලි කරන ලදී. මෙහි සඳහන් කරන ලද්දේ වැඩි වශයෙන් දක්නට ලැබෙන වැරදි වර්ග පිළිබඳ ව බව සලකන්න. ගිණුම්කරණයේ දී තවත් වැරදි සිදු විය හැකි අතර ඒවා නිසි පරිදි නිවැරදි කිරීමට උත්සාහ ගත යුතු වේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ක්‍රියාකාරකම 05

දේවකගේ ව්‍යාපාරයේ ගිණුම් පොත් පරීක්ෂා කිරීමේ දී පහත සඳහන් වැරදි හෙළිදරව් විය. එම වැරදි නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ජ'නල් සටහන් ඉදිරිපත් කරන්න.

i. රු. 4,000ක ගැනුම් ඉන්වොයිසියක් පොත්වල සටහන් කර නොමැත.
ii. බැංකු ණය ගිණුම තුලනය කිරීමේ දී රු. 1,000ක් අඩු වී තිබේ.
iii. රු. 1,400ක ආපසු එවුම් වට්නාකම ආපසු යැවුම් ගිණුමේ ලියා ඇත.
iv. මෝටර් රථ අලුත්වැඩියා වියදම් රු. 3,500 මෝටර් රථ ගිණුමේ ලියා තිබේ.
v. රු. 15,000ක ලී බඩු ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට පිටපත් කර නැත.

ක්‍රියාකාරකම 06

චතුරිකාගේ ව්‍යාපාරයේ 20XX ජූනි 30 දිනට සකස් කළ ශේෂ පිරික්සුම තුලනය නොවුයෙන් එහි වෙනස වු රු. 4,500 අවිනිශ්චිත ගිණුමක බැර පැත්තේ සටහන් කරන ලදී. ගිණුම් පොත් පරීක්ෂාවෙන් පහත දැක්වෙන වැරදි අනාවරණය කර ගත හැකි විය.

i. ණය ගැතියෙකු විසින් ආපසු එවන ලද රු. 3,000ක භාණ්ඩ පිළිබඳ ව ණය ගැති ගිණුමේ ලියා නැත.
ii. රු. 500ක ලිපි ද්‍රව්‍ය මිලට ගැනීම ගිණුම්වල දෙවරක් ලියා තිබිණ.
iii. රු.1,250ක ගොඩනැගිලි කුලී ගෙවීම ගිණුම් දෙකෙහි ම හර කර තිබිණ.
iv. දුන් වට්ටම් රු. 1,200 ශේෂ පිරික්සුමට පිටපත් කර නැත.
v. රු. 2,200ක පොලී ආදයම් ලැබීම මුදල් පොතේ නිවැරදි ව ලියා ඇතත් ලද පොලී ගිණුමේ සටහන් කර ඇත්තේ රු. 2,000ක් වශයෙනි.

අ. මෙම වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන් ඉදිරිපත් කරන්න.
ආ. අවිනිශ්චිත ගිණුමේ ශේෂය ඉවත්ව යන ආකාරය දක්වන්න.

ක්‍රියාකාරකම 07

බන්දුසිරිගේ ව්‍යාපාරයේ 20XX මාර්තු 31 දිනට සකස් කළ ශේෂ පිරික්සුම තුලනය නොවීය. එම වෙනස රු. 3,400/ අවිනිශ්චිත ගිණුමක හර පැත්තේ ඇතුළත් කරන ලදී. පසුව පරීක්ෂා කිරීමේ දී පහත දැක්වෙන ගිණුම්කරණ වැරදි හෙළිදරව් කර ගත හැකි විය.

i. ණය ගැතියෙකු විසින් ආපසු එවන ලද රු. 800ක භාණ්ඩ පිළිබඳ ව ණය ගැති ගිණුමේ පමණක් සටහන් ව තිබිණි.
ii. රු. 3,300ක ලද පොලී එම ගිණුමේ ලියා තිබුනේ රු. 3,000ක් ලෙසිනි.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

iii. දුන් වට්ටම් රු. 600 ලද වට්ටම් ලෙස එම ගිණුමේ ලියා තිබිණ.

iv. ප්‍රචාරණ ගාස්තු ගිණුමේ රු.1,700ක ශේෂය ඉදිරි පිටුවට ගෙනවිත් නැත.

අ. මෙම වැරදි නිවැරදි කරන ආකාරය පොදු ජ'නලයේ ලියා දක්වන්න.

ආ. අවිනිශ්චිත ගිණුම සකස් කරන්න.

3.7 වැරදි නිවැරදි කර ශේෂ පිරික්සුම තුලනය කිරීම

ශේෂ පිරික්සුමෙන් හෙළිදරව් වන වැරදි මෙන් ම ශේෂ පිරික්සුමක් මගින් හෙළිදරව් නොවන වැරදි ද නිවැරදි කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳ ව දැන් ඔබට අවබෝධයක් තිබේ. එම නිසා වැරදි නිවැරදි කිරීමෙන් පසුව අවිනිශ්චිත ගිණුම ඉවත් ව යන සහ ශේෂ පිරික්සුමේ හර ශේෂයන්ගේ එකතුව බැර ශේෂයන්ගේ එකතුවට සමාන වන ආකාරය නිදසුනක් ඇසුරින් පැහැදිලි කර ගනිමු.

නිදසුන් ලොකුගේ ව්‍යාපාරයේ 20XX ජූනි 30 දිනට සකස් කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

ලොකුගේ ව්‍යාපාරය

20XX ජූනි 30 දිනට ශේෂ පිරික්සුම

විස්තරය	හර රු.	බැර රු.
ගැනුම් ගිණුම	48,000	
විකුණුම් ගිණුම		75,000
ණය ගැති ගිණුම	6,500	
ණය හිමි ගිණුම		7,000
බැංකු ණය ගිණුම		14,000
කාර්යාල උපකරණ ගිණුම	24,000	
විවිධ ආදායම් ගිණුම		6,000
විදුලි වියදම් ගිණුම	3,000	
වේතන ගිණුම	14,000	
මෝටර් රථ ගිණුම	224,000	
ගොඩනැගිලි කුලී ගිණුම	13,000	
අලුත්වැඩියා වියදම් ගිණුම	3,700	
රක්ෂණ ගිණුම	4,000	
ආපසු එවුම් ගිණුම	2,400	
ආපසු යැවුම් ගිණුම		3,600
ගැනිලි ගිණුම	1,500	
මුදල් ගිණුම	13,800	
ප්‍රාග්ධන ගිණුම		250,000
අවිනිශ්චිත ගිණුම		2,300
	357,900	357,900

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මෙම ශේෂ පිරික්සුම අධ්‍යයනය කිරිමෙන් එහි බැර පැත්තේ ශේෂයන්ගේ එකතුව හර පැත්තේ ශේෂයන්ගේ එකතුවට වඩා රු. 2,300ක් අඩු බවත් ඒ වෙනුවෙන් අවිනිශ්චිත ගිණුමක් විවෘත කර ඇති බවත් ඔබට පැහැදිලි වනු ඇත.

දැන් අපි ශේෂ පිරික්සුම අසමාන වීමට හේතු අනාවරණය කර ගැනීමට සූදානම් වෙමු.

ඉහත නිදසුනේ සඳහන් ලොකුගේ ව්‍යාපාරයේ මූලාශ්‍ර ලියවිලි, මූලික පොත්, ලෙජර ගිණුම් සහ ශේෂ පිරික්සුම හොඳින් පරීක්ෂා කිරීමෙන් පහත දැක්වෙන වැරදි අනාවරණය කර ගෙන ඇත.

1. රු. 3,500ක ගැනුම් ඉන්වොයිසියක් පොත්වල සටහන් වී නැත.
2. රු. 400ක රක්ෂණ ගාස්තු ගෙවීම මුදල් පොතේ නිවැරදි ව ලියා ඇතත් රක්ෂණ ගාස්තු ගිණුමේ ලියා නැත.
3. ලද වට්ටම් රු. 2,900 ශේෂ පිරික්සුමට පිටපත් කර නැත.
4. කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරිම සඳහා ගෙවූ රු. 1,500 කාර්යාල උපකරණ ගිණුමේ ලියා ඇත.
5. රු. 1,000ක බැංකු ණය ගෙවීම මුදල් පොතේ පමණක් ලියා ඇත.
6. රු. 150ක භාණ්ඩ ආපසු එවීම ණයගැති ගිණුමට හර කර තිබේ.
7. විවිධ ආදායම් වශයෙන් ලද රු. 6,500 එම ගිණුමේ සඳහන් ව ඇත්තේ රු. 6,000ක් වශයෙනි.

ඉහත දැක්වෙන ගිණුම්කරණ වැරදි හොඳින් කියවන්න. මෙම වැරදි අතුරින් ඇතැම් වැරදි තිබුණ ද ශේෂ පිරික්සුම තුලනය වන බවත් ඇතැම් වැරදි ශේෂ පිරික්සුමේ ඓක්‍යය අතර වෙසක් ඇති වීමට හේතු වන බවත් පැහැදිලි කර ගනිමු.

- අංක (1) සහ (4) යන වැරදි නිසා ශේෂ පිරික්සුමේ ඓක්‍යය අතර වෙනසක් ඇති වීමට බල නොපායි.
- අනෙකුත් වැරදි නිසා ශේෂ පිරික්සුමේ ඓක්‍යය අතර වෙනසක් ඇති වේ. එම නිසා මෙම වැරදි නිවැරදි කිරීමේ දී අවිනිශ්චිත ගිණුමේ තබා ඇති සටහන් ඉවත් වන බව සැලකිල්ලට ගැනීම වැදගත් ය.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

වැරදි නිවැරදි කරන ආකාරය පහත දක්වේ.

පොදු ජ'නලය

දිනය	ව. අ.	විස්තරය		ලෙ. පි	හර රු	බැර රු
20xx.06.30		ගැනුම් ගිණුම ණයහිමි ගිණුම රු. 3,500ක ගැනුම් ඉන්වොයිසියක් සටහන් නොවීමෙන් වු වරද නිවැරදි කිරීම.	හර		3,500	 3,500
20xx.06.30		රක්ෂණ ගාස්තු ගිණුම අවිනිශ්චිත ගිණුම ගෙවන ලද රු. 400ක රක්ෂණ ගාස්තු එම ගිණුමේ සටහන් නොවීමෙන් වු වරද නිවැරදි කිරීම.	හර		400	 400
20xx.06.30		අවිනිශ්චිත ගිණුම ලද වට්ටම් 2,900 ශේෂ පිරික්සුමට පිටපත් නොවීමෙන් වු වරද නිවැරදි කිරීම.	හර		2,900	
20xx.06.30		කාර්යාල උපකරණ අලුත්වැඩියා ගිණුම කාර්යාල උපකරණ ගිණුම කාර්යාල උපකරණ අලුත්වැඩියා වියදම් රු.1,500 කාර්යාල උපකරණ ගිණුමේ ඇතුළත් කිරීමෙන් වු වරද නිවැරදි කිරීම.	හර		1,500	 1,500
20xx.06.30		බැංකු ණය ගිණුම අවිනිශ්චිත ගිණුම ගෙවන ලද රු. 1,000 බැංකු ණය එම ගිණුමේ සටහන් නොවීමෙන් වු වරද නිවැරදි කිරීම.	හර		1,000	 1,000
20xx.06.30		අවිනිශ්චිත ගිණුම ණය ගැති ගිණුම ආපසු එවන ලද රු. 150ක භාණ්ඩ ණය ගැති ගිණුමේ හර පැත්තේ සටහන් කිරිමෙන් වු වරද නිවැරදි කිරීම.	හර		300	 300
20xx.06.30		අවිනිශ්චිත ගිණුම විවිධ ආදයම් ගිණුම රු. 6,500ක විවිධ ආදයම් රු. 6,000ක් ලෙස එම ගිණුමේ සටහන් වීමෙන් වු වරද නිවැරදි කිරීම.	හර		500	 500

ඉහත දැක්වෙන අයුරින් සොයා ගත් වැරදි සියල්ල ම නිවැරදි කරන ආකාරය තේරුම් ගැනීමට උත්සාහ කරන්න. ඉන් පසු ශේෂ පිරික්සුමේ ඇතුළත් කර තිබෙන රු. 2,300ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය ඉවත් ව යන ආකාරය විමසා බලමු.

හර **අවිනිශ්චිත ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු
	....		2,900		ශේෂ පිරික්සුමේ වෙනස		2,300
	ණයගැති ගිණුම		300		රක්ෂණ ගිණුම		400
	විවිධ ආදායම් ගිණුම		500		බැංකු ණය ගිණුම		1,000
			3,700				**3,700**

දැන් අපි වැරදි නිවැරදි කිරීමෙන් පසුව ශේෂ පිරික්සුම සකස් කර තුලනය වන අයුරු බලමු.

ලොකුගේ ව්‍යාපාරය
20XX ජූනි 30 දිනට ශේෂ පිරික්සුම

විස්තරය	හර රු.	බැර රු
ගැනුම් ගිණුම	**51,500**	
විකුණුම් ගිණුම		75,000
ණයගැති ගිණුම	**6,200**	
ණයහිමි ගිණුම		**10,500**
බැංකු ණය ගිණුම		**13,000**
කාර්යාල උපකරණ ගිණුම	**22,500**	
විවිධ ආදායම් ගිණුම		**6,500**
විදුලි වියදම් ගිණුම	3,000	
වේතන ගිණුම	14,000	
මෝටර් රථ ගිණුම	224,000	
ගොඩනැගිලි කුලී ගිණුම	13,000	
අලුත්වැඩියා වියදම් ගිණුම	**5,200**	
රක්ෂණ ගිණුම	**4,400**	
ආපසු එවුම් ගිණුම	2,400	
ආපසු යැවුම් ගිණුම		3,600
ගැනිලි ගිණුම	1,500	
මුදල් ගිණුම	13,800	
ප්‍රාග්ධන ගිණුම		250,000
ලද වට්ටම්		**2,900**
	361,500	**361,500**

නොමිලේ බෙදහැරීම සඳහා ය.

වැරදි නිවැරදි කිරීමෙන් පසු අවිනිශ්චිත ගිණුම ඉවත් වී ඇති බවත් ශේෂ පිරික්සුමේ හර ශේෂයන්ගේ එකතුව බැර ශේෂයන්ගේ එකතුවට සමාන වී ඇති බවත් දැන් ඔබට පැහැදිලි වී ඇතැයි සිතමි. පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල යෙදීමෙන් ඔබ ලත් දැනුම තවදුරටත් තහවුරු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

ක්‍රියාකාරකම් 08

20XX.12.31 දිනට සජානිගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම තුලනය නොවූයෙන් වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරුකොට තාවකාලික ව තුලනය කරන ලදී.

සජානිගේ ව්‍යාපාරය

20xx.12.31 **දිනට ශේෂ පිරික්සුම**

ගිණුමේ නම	හර රු.	බැර රු
තොගය 20xx.01.01 දිනට	25,000	
බැංකු මුදල්	60,000	
අතැති මුදල්	10,500	
ප්‍රාග්ධනය		240,000
ගැනුම්	155,000	
විකුණුම්		328,750
වැටුප්	10,000	
ගෙන ඒමේ කුලී	11,000	
පොදු වියදම්	5,000	
ලද වට්ටම්		1,000
ලී බඩු හා සවිකිරීම්	15,000	
ප්‍රචාරණය	3,500	
රක්ෂණය	8,500	
විකුණුම් කොමිස්	4,500	
තැපැල් හා දුරකථන	8,750	
වේතන	57,500	
බදු හා වරිපනම්	2,500	
ගැනිලි	12,000	
ආපසු යැවුම්		8,000
දුන් වට්ටම්	7,000	
මෝටර් රථ	100,000	
ඉඩම් හා ගොඩනැගිලි	60,000	
විවිධ ණයගැතියෝ	50,000	
විවිධ ණය හිමියෝ		30,000
අවිනිශ්චිත ගිණුම	2,000	
	607,750	607,750

පහත දැක්වෙන වැරදි හා අඩුපාඩු සොයා ගන්නා ලදී.

1. රු. 3,000ක විකුණුම් ඉන්වොයිසියක් සටහන් කිරීම මගහැරී තිබීම.
2. රු. 5,000ක වැටුප් ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් කර තිබීම.
3. රු. 3,000ක ලී බඩු හා සවිකිරීම් අලුත්වැඩියා කිරීම අදාළ වත්කම් ගිණුමට හරකර තිබීම.
4. රු. 5,300ක රක්ෂණ ගාස්තු රක්ෂණ ගිණුමේ රු. 3,500ක් ලෙස සටහන් කර තිබීම.
5. රු. 5,000ක ගැනුම් ඉන්වොයිසියක් අදාළ ගිණුම් දෙකේම දෙවරක් සටහන් කර තිබීම.
6. ඇසුරුම් වියදම් ගිණුමේ ශේෂය වූ රු. 6,000 ශේෂ පිරික්සුමට පිටපත් කර නොතිබීම.
7. රු. 10,800ක ණයට ගැනුම්, ගැනුම් ගිණුමේ නිවැරදි ව සටහන්කොට අදාළ ණය හිමි ගිණුමට බැරකර නොතිබීම.
8. රු. 1,000ක බදු හා වරිපනම් ගෙවීම අදාළ ගිණුම් දෙකෙහිම පැති මාරුකොට ලියා තිබීම.

ඔබ විසින්

i. වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන්
ii. අවිනිශ්චිත ගිණුම
iii. වැරදි නිවැරදි කිරීමෙන් පසු ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.